# AN ACTION RESEARCH ON IMPROVING STUDENT PERFORMANCE IN GENERAL ENGLISH AT G. C. E. (A/L) EXAMINATION

D. S. ATHUKORALA

B.A., PGDE, M.A.

M.Ed PROGRAMME

FACULTY OF EDUCATION

OPEN UNIVERSITY OF SRI LANKA

DECEMBER 2013

OPEN UNIVERSITY

70888

70888

## ABSTRACT

General English is taught as a subject in G. C. E. A/L classes and its syllabus focuses on the required knowledge of working places in Sri Lanka. However, it has been observed that most of the G. C.E. A/L students neglect the subject without considering its importance to them once they leave school. This was seen as a problem for the language teacher who engages in the learning teaching process of this subject. Further, the statistics of the Department of Examinations also reveal that the percentage of the students who pass this subject is at a low rate and it is around 30 %.

Thus, this research study was conducted with the aim of improving the knowledge of General English in G.C. E. A /L students. The sample of students consisted of twenty students from Sri Rahula Balika Maha Vidyalaya, Malabe. The sample was selected considering the marks obtained for General English at the term test. Further, there was a questionnaire to find out the factors that lead to low performance of General English.

Having analyzed the responses of the questionnaire, four factors have been identified as the causes which led to the low performance in General English. They were low performance in English Language at G. C. E. (O/L) Examination, Disliking towards General English, less exposure to General English and also poor socio- economic backgrounds in relation to their respective families.

The Intervention Programme designed for the research study consisted of three cycles and it was within a period of three months. However, it was considered that motivating students towards learning was significant in the teaching learning process. Thus, more attention has been paid to motivate students during the research process. Research methodology consisted of proficiency tests, observation schedules, innovative teaching methods such as language games songs, films and also the computer aided learning materials. These teaching

techniques were very much applicable to the adolescents in the Sri Lankan context as they helped to lower their inhibitions as well as their anxiety.

In the process of improving the knowledge of General English, Audio Lingual Method was considered when practicing grammar structures and also in drilling sentences. Further, Input Hypothesis and Affective filter Hypothesis of Stephen Krashen's Monitor Model and also Output Hypothesis of Swain and her associates which deal with Second Language Acquisition too were considered in designing various activities such as Language games, group activities and computer aided lessons and also information gap activities. Those activities catered to the needs of all kinds of learners. Moreover, Gardner's theory and Dornyei's Model too had to be referred in inculcating positive attitudes and creating a learner friendly atmosphere within the classroom and thereby motivating the students towards learning.

Proficiency of a language lies in its usage of expressions and the knowledge of forming sentences is vital in this process. Thus, the Intervention Programme was based on the knowledge of grammar and the emphasis was given on forming Passive sentences. However, computer aided lessons and DVD films such as "Sound of music", "My fair lady" and "Marry Poppins" and also the drama "Villa for sale" motivated more students towards learning General English.

As only one hour could be used after school in three months for the Intervention Programme, there was not sufficient time to achieve complete success of it. Further, the selected sample consisted of only female students.

Moreover, negative attitudes towards the subject, General English too could be considered as a hindrance in achieving the expected knowledge. Thus, it was evident that more attention should be paid in inculcating positive attitudes and motivating students towards learning in order to achieve success in improving the knowledge of General English.

ABSTRACT (උපුටා ගැනීම)

සාමාන්‍ය ඉංග්‍රීසි අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල විෂයයක් ලෙස උගන්වන අතර එහි විෂයය මාලාව මගින් රැකියාවකට අවශ්‍ය ඉංග්‍රීසි දැනුම ලබා දෙයි. සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය මාලාව ව්‍යාකරණ පුණරීක්ෂණ, ජනප්‍රිය සිංදු හා කවි විනෝදාත්මක කතාවන්, කාලීන මාතෘකා යටතේ ලිපි හා ශ්‍රවණ, කථන, ලිවීම හා කියවීම යන නිපුණතාවයන්ට අදාල ක්‍රියාකාරකම් වලින්ද සමන්විතයි. එහෙත් බෙහෝ අ.පො.ස. උසස් පෙළ සිසු සිසුවියන් තම පාසැල් ජීවිතය අවසන් වීමෙන් පසු අවශ්‍ය වන ඉංග්‍රීසි දැනුම ගැන නොසලකා මෙම විෂයය ඉගෙන ගැනීම අතපසු කරයි. මෙම තත්වය ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුවරුන් හට ගැටළුවක් ලෙස පෙනී ගොස් ඇති අතර විභාග දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන වලට අනුව මෙම විෂයය සමත් වන ප්‍රතිශතය 30% ක් පමණ වන බව පෙනී ගොස් ඇත.

මෙම පර්යේෂණ අධ්‍යයනය අ.පො.ස. (උසස් පෙළ) ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ සාමාන්‍ය ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද්දකි. තොරාගත් නියැදිය ශ්‍රී රාහුල බාලිකා ම. වි. මාලඹේ හි සිසුන් 20 දෙනෙකුගෙන් සමන්විතයි. මෙම සිසුන් නියැදිය තෝරා ගන්නා ලද්දේ වාර විභාගය සඳහා ඔවුන් ලබාගත් ලකුණු සලකා බැලීමෙන් අනතුරුවය. තවද මෙම ඌණ ප්‍රවීනත්වයට හේතු සලකා බැලීම සඳහා එම සිසුන් වෙත ප්‍රශ්ණාවලියක් ද යොමු කරන ලදී. එම සිසුන් ලබා දී ඇති පිළිතුරු වලට අනුව සාමාන්‍ය ඉංග්‍රීසි භාවිතය සඳහා අනාවරණය නොවීම, තම පවුල් වලට අදාලව පවතින දුප්පත් සමාජ ආර්ථික පසුබිම යන කරුණු සිසුන්ගේ ඌණ ප්‍රවීණත්වයට බලපා ඇති බව සොයා ගන්නා ලදී.

පර්යේෂණ අධ්‍යයනය සඳහා සැලසුම් කරන ලද මැදිහත්වීමේ ක්‍රියාදාමය වට තුනකින් සමන්විත වූ අතර ඒ සඳහා මාස තුනක් ගතවිය. කෙසේ වෙතත් අදාල විෂයය ඉගැන්වීම සඳහා සිසුන්ගේ කැමැත්ත අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා වැඩි අවධානයක් පර්යේෂණ ක්‍රියාවලියේදී යොදවන ලදී. පර්යේෂණ ක්‍රමවේදය නියැදියේ සිසුන්ගේ නිපුණතා ඇගයීම්, හැසිරීම් රටාව අධ්‍යයනය කිරීම හා නවීන තාක්ෂණය උපයෝගී කරගෙන කෙරෙන පරිඝණක භාවිතයෙන් ඉගැන්වීම, භාෂා ක්‍රීඩාවන්හි යෙදීම හා චිත්‍රපට හා සිංදු යනාදියෙහි රසවිඳීමට සැලැස්වීම යන කරුණුවලින් සමන්විත වුනි.

සාමාන්‍ය ඉංග්‍රීසි දැනුම වර්ධනය කරන ක්‍රියාවලියේදී ව්‍යාකරණ භාවිතය පුහුණුවීම් සඳහා ශ්‍රවන භාෂා ක්‍රමය (Audio Lingual Method) යන ක්‍රමය විශේෂයෙන්ම යොදා ගන්නා ලදී. තවද විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී Krashen ගේ Monitor Model යන ක්‍රමයට අදාලව දී Input Hypothesis හා Affective Filter Hypothesis, Swain හා ඇයගේ සගයන් ඉදිරිපත් කල Output

Hypothesis යන උපකල්පන සලකා බලන ලදී. මෙම ක්‍රියාකාරකම් සෑම ආකාරයකටම ඉගෙන ගන්නා ළමුන් සඳහා සුදුසු ක්‍රමයක් විය. එමෙන්ම Gardner's Model හා Dornyei Model සිසුන්ගේ ධනාකල්ප වර්ධනය හා ඉගෙනුමට අවශ්‍ය වාතාවරණය, පන්ති කාමරය තුල ඇති කිරීමට යොදා ගන්නා ලදී. මෙමගින් නියැදියේ සිසුන්ගේ විෂයය සඳහා ඇති කැමැත්ත වර්ධනය කිරීමට උපකාරි විය.

භාෂාවක නිපුණත්වය රදාපවතින්නේ පාවිච්චි කරන වදන් මත වන අතර වාක්‍ය සකස් කිරීමේ දැනුම මෙම ක්‍රියාවලියේදී විශේෂ තැනක් ගනී. එබැවින් මැදිහත්වීමේ ක්‍රියාදාමය තුළ ව්‍යාකරණ දැනුම වර්ධනය කිරීම සඳහා වැඩිපුර කාලයක් යෙදවූ අතර එයින් ද කර්මකාරක වාක්‍ය සඳහා වැඩිපුර කාලයක් ගත කරන ලදී. පළමුවන වටය තුල සිසුන් පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් සකස් කල අතර දෙවන වටයේදී සිසුන් හතර දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් පරිඝණක ආශ්‍රිත පාඩම් වලට යොමු කරන ලදී. තෙවන වටයේදී සිසුන්ගේ ශ්‍රවණ තත්වය හා තේරුම් ගැනීමේ හැකියාව යන නිපුණතා වර්ධනය කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වූ අතර ජනප්‍රිය චිත්‍රපට (Sound of Music, My Fair Lady) හා නාට්‍ය (Villa for Sale) බැලීමට අවස්ථාව ලැබුණු අතර මෙමගින් සිසුන් විෂයය ඉගෙන ගැනීමට පෙළඹවීමටද අවධානය යොමු කරන ලදී. තරුණ වියට පාතබන ශ්‍රී ලංකාවේ සිසුන් සඳහා මෙම ඉගැන්වීම් ක්‍රම වඩාත් උචිත වන අතර ඔවුන්ගේ පසුබෑම හා ලැජ්ජාශීලි බව ද අඩුකර ගැනීමට මෙම ක්‍රම හේතු විය.

පාසැල් වේලාවෙන් පසු දවසකට පැයක් පමණ මෙම මැදිහත්වීමේ ක්‍රියාවලිය යොදා ගැනීම හේතුවෙන් වැඩිපුර කාලයක් යෙදවීමට නොහැකිවීම නිසා පූර්ණ සාර්ථකත්වය ලබා ගැනීමට නොහැකි විය. තවද නියැදියේ සියලුම සිසුන් බාලිකාවන් වීමද පර්යේෂණ අධ්‍යයනයේ සීමාවන් ලෙස සැලකිය හැක.

මෙම පර්යේෂණය මගින් සිසුන්ගේ ඌණ ප්‍රවීනත්වයට හේතු සාධක වන කරුණු හතරක් හඳුනාගෙන ඇත. එම කරුණු වන්නේ අ.පෙ.ස. (සා/පෙළ) විභාගයේදී දැක්වූ ඌණ ප්‍රවීනත්වය , සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා ඇති අකමැත්ත, සාමන්‍ය ඉංග්‍රීසි භාවිතා කරන පරිසරයකට අනාවරණය නොවීම හා සිසුන්ගේ පවුල් වල ඇති දුප්පත් සමාජ ආර්ථික තත්වයයි.

තවද සිසුන් සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය කෙරෙහි දක්වන සෘණ ආකල්පද බලාපෙරොත්තු වන දැනුම ලබාගැනීමට බාධාවක් ලෙස සැලකිය හැක. එබැවින් සිසුන්ගේ සාමාන්‍ය ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීමෙහි සාර්ථකත්වය සඳහා ධන ආකල්ප ඇතිකිරීමට සිසුන් ඉගෙනීමට යොමු කිරීමටත්, වැඩිපුර අවධානයක් යෙදවීමට අවශ්‍යව ඇත.